


සැප්තැම්බර් මාසය සාහිත්‍ය මාසයයි. මේ මාසය සාහිත්‍ය මාසය ලෙස නම් කර තිබෙන්නේ අවම වශයෙන් මේ මාසයේදී වත් සාහිත්‍යය කෙරෙහි අවධානයක් යොමු කරන්නැයි සමාජයෙන් ඉල්ලීමක් කරන්නටය.

සාහිත්‍යයට අපේ සමාජයේ ඇත්තේ ඉතා අවම සැළකිල්ලකි. බෙහෝ දෙනා සාහිත්‍යය සළකන්නේ අනවශ්‍ය වැදගැම්මකට නැති දෙයක් ලෙස ය යන්න නොරහසකි. සාහිත්‍යය ඉගෙන ගැනීමෙන් බඩ පිරෙන්නේ නැතැයි ප්‍රසිද්ධියේ දෙසා බෑ නායකයන් සිටිය රටක උපන් අප තවමත් පොත පත කියවීමම පුදුමයකි.

ලෝකය දෙස නිවැරදිව බලන්නට උගන්වන්නේ සාහිත්‍යය යි. ලෝකය දෙස සෞන්දර්යවාදීව බලන්නට උගන්වන්නේ සාහිත්‍යය යි. මිනිසා සතුන්ගෙන් වෙන් කර තබන්නට, මිනිසා යන්ත්‍රයක් නොවන තැනට වග බලා ගන්නට සාහිත්‍යයට හැකියාවක් ඇත. අපේ දරුවන් තව තවත් පෙත පතට හුරු කළ යුත්තේ එනිසා ය.

සාහිත්‍යයේ අගය වටහාගත් දෙමාපියන් තවමත් අප අතර අනන්තවත් ඇත. දරුවන්ගේ උපන් දිනයකදී අරුමෝසම් බඩු හෝ සෙල්ලම් බඩු හෝ දෙනු වෙනුවට පොත පත මිලට ගෙන දෙන දෙමාපියන් අපි දැක ඇත්තෙමු. ඒ දරුවෝ ද ඒ පොත පත කියවා සෙල්ලම් බඩුවකින් ලද නොහැකි වටිනාකමක් ජීවිතයට එකතු කර ගනිති. එවන් දරුවන් පරිණත මිනිසුන් වන සැටි ද අපි ආශ්වාදයකින් බලා සිටින්නෙමු.




# පණ්ඩිත ඇණුම්පද

ජේ බී දිසානායක මහාචාර්ය තුමා විසින් ලියන ලද රට ගිය ඇත්තන්ගේ සිංහල යන ශීර්ෂ පාඨය සහිත ලිපියක් සන්නස අගෝස්තු කලාපයෙහි පළ වී තිබිණි. ඇත්තටම එම ලිපිය මහාචාර්යතුමා විසින් ලියන ලද්දක් ද යන සැකය මතු නූණේ එතුමාගේ සේරුව ද සහිතව එම ලිපිය පළ වී තිබුණු නිසා ය.
මගේ ගුරුවරුන් මට ඉගැන්වූ - පත පොතින් මා ඉගෙන ගත් වියරණ රීති හා භාෂා ව්‍යවහාර සමඟ ගැටෙන තැන් කීලයක් එහි තිබුණු අතර එකඟ විය නොහැකි අදහස් කීපයක් ද එහි විය. මහාචාර්යතුමාගේ දැනුත් මගේ දැනුමත් සැසඳුවහොත් එය සීගිරි පව්වත් කුස්ටරාජගලත් වැනි යයි මට සිතේ. එහෙත් ගුරුවරයකු වශයෙන් අවුරුදු තිස් පහක් සිංහල දරුවන්ට සිංහල ඉගැන්වූ මට මගේ සිංහල දැනුමේ නිරවද්‍යතාව ගැන විශ්වාසයක් ඇත. මේ ලිපියෙහි දොස් ලෙස මට පෙනෙන තැන් යතුරු දොස් ද නැතහොත් මහාචාර්යතුමා මනස එකලස්ව නොතිබි වේලාවක ලියූවක් ද යන්න මම නොදනිමි.

කවර භාෂාවකට වුවත් අවුරුදු දහස් ගණනක අතීතයක් ඇත. එය ගසකට උපමා කිරීම නිවැරදි යයි සිතමි. දෙමළ, සකු, මගද බස් රිසිවර මුවින් පහළ වූ බව කියතත් මම එය නොපිළිගනිමි. පහළ වීම බිහිවීම ක්ෂණික සිදුවීමකි. එනිසා භාෂාවක් පහළ වන එකකැයි හෝ බිහි වන එකකයි කීම බොලඳ අදහසකි.

එම ලිපියේ තුන් හතර පළකම සඳහන් වන -යාම- නිවැරදි නම් කෑම, නෑම, ලෑම, සෑම, ගෑම ද ඒ අනුව කාම, නාම, ලාම, සාම, ගාම ලෙස වෙනස් විය යුතු ය. ළමයකු -යාම- ලියා තිබුණොත් මම එය යටින් ඉරක් අඳිමි.එසේ ම අවශ්‍යතාවය, අත්‍යාවශ්‍ය යන පද යටින් ද ඉරක් අඳිමි. අවශ්‍යතා අ = අවශ්‍යතාව, අති අවශ්‍ය = අත්‍යවශ්‍ය නිවැරදි වහර නිසාය ඒ.

එතුමාගේ ලිපියේ (අග) "එහෙත් විදේශ ගත..." යන වැකිය "එහෙත්" යන්නෙන් පටන් ගන්නා රතුමා වෙනත් වැකි කීපයක් "නමුත්" යන්නෙන් පටන් ගනී. නම් දු - නමුදු - නමුද් - නමුත් යන පදය වැකියක මුලට යෙදූ විට සිතන අදහස නොලැබේ. එසේ බස් වැඩීමක් නො වේ.
"පණ්ඩිතයෝ එය වටහා ගත යුතු ය" - "පණ්ඩිතයන් අවබෝධ කොට ගත යුතු ය" යන වැකි දෙකෙන් මුල් වැකියේ ඇති "පණ්ඩිතයෝ" යන්න කිසියම් ප්‍රමාදයකින් ලියැවුණු එකක් යයි සිතමි. එහෙත් "මිනිසුන් බස රිසි පරිදි... අවශ්‍යතාව(ය) වෙනුවෙන් .... හසුරුවයි" " පාලි සංස්කෘත වැනි භාෂා අප එදා ... අදත් භාවිතා කරය" "එම වෙනස සිදු කරන්නේ (ද) භාෂාව භාවිතා කරන්නෝ ය", "අපි ගොල්ෆ් ගැසුවේ නැත" "අපි ජිරාෆ් කියලා සතෙක් දැකලා තිබුණේ නැත", "අපි දැන් අඳින ඇඳුම පවා පෘතුගීසීන්ගෙන් ලැබුණු දෑ ය","සන්නි-වේදකයෝ ජන මාධ්‍ය (ය) යන්න .. අවබෝධ කොට ගත යුතු ය", "මව් බස අමතක බව අයෙක් කියන්නේ නම් එය ද මුසාවකි" යන වැකි වලින් සමහරක උක්තාඛ්‍යාත සම්බන්ධය වැරදිය. තවත් සමහරක උක්තානුක්ත යෝගය වැරදි ය. "මනාලයා මනාලියගේ වම් පැත්තේ සිටගත යුතු ... සම්මතයක් ඇත" යන්න ද හදිසියට පැත්ත මාරුවීමක් විය හැකි ය.

තරග/තරඟ, කලබ/කලඹ, දියබ/දියඹ, පසිදු/පසිඳු වැනි වචන අල්ලාගෙන කුඩ මිටි හරස් කර ගත යුතු නැත. එසේම බඩු/බඬු, මඬු/මඩු, මඳි/මදි, නිඳි/නිදි වැනි වචන ද තමන් කැමති කැමති විදියට භාවිතා කළ හැකි ය. එහෙත් තරක් වීම/ තරං වීම, උමංදාව - ඉනිමං කෙටිය/ උමග්දාව - ඉනිමග් කෙටිය වූ විට වැටෙන ගැටය ලිහා ගැනීම ටිකක් අසීරු වනු ඇත. ඝෝෂාක්ෂර (ග,ජ,ඩ, ද,බ) සඤ්ඤක වීමත් සඤ්ඤකාක්ෂර (ඟ, ඦ, ඬ, ඳ, ඹ) ඝෝෂ වීමත් සාමාන්‍ය සිද්ධියකි.
"විද්‍යාලයය හා පුස්ථකාලය අමතක කොට විද්‍යාලය හා පුස්තකාලය ලෙස එකී වචන වෙනස් කර ගැනීමට" යන වැකියෙන් පැව-සෙන්නේ විද්‍යාලයය/පුස්ථකාලය වෙනුවට විද්‍යාලය/පුස්තකාලය භාවිතා කිරීමට පටන් ගෙන ඇති බවය්. මෙතැන නිවැරදි වචනය වන "පුස්තකාලය" නැවත "පුස්තකාලය" ලෙස වෙනස් කර ගැනීම හොඳ සිහියෙන් කරන වැඩක් නොවේ.
මම මහාචාර්යතුමාගේ "උඩරට සිංහලය" කියවා ඇත්තෙමි. උඩරට සිංහල අකුරුම පහතරට සිංහල ලියන්නටත් භාවිතා කිරීම භාග්‍යයකි. එහි වැලිවිට සරණංකර හිමියන්ගේ කාලයේ ලියවුණු විල්බාගෙදර රාලගේ " තානාපති ගමන් විස්තරය" සිත්ගන්නාසුලු ලියවිල්ලකි. වැලිවිට සරණංකර හිමියන්ගේ අත් අකුරින් ලියන ලද පුස්කොල පත් ඉරුවද ඉතා වැදගත් ය.
"භාෂාව එක් අතකට මිනිසුන්ගේ සිතුම් පැතුම් සමඟ ඉදිරියට යන දෙයකි--ජීව භාෂාවක් වෙනස් වෙමින් සංශෝධනය වෙමින් ගමන් කරන්නේ යම් දියුණුවක් වෙත ය" මේ කියම-න් අනුව අප තේරුම් ගත යුත්තේ පොළොන්නරු යුගයේ සිංහලයට වඩා කෝට්ටේ යුගයේ සිහලයත්, කෝට්ටේ යුගයේ සිංහලයට වඩා මහනුවර යුගයේ සිංහලයත් ඉදිරියට ගොස් ඇති බවය. වැටුණු බස ගොඩ නැගුණු හැටි දන්නෝ දනිති.
"ඇඳුම්- යන වචනයත් කමීස, කලිසම.. මේ සියල්ලත් අපට පෘතුගීසි ආගමනයෙන් පසුව ලැබුණු ඒවාය" සකෝ බලලෝ - සකෝ ලෝ බල - සැක්කරයො ලෝකෙ (දිහා) බලහං. - අඳ- ධාතුවට -උම්- ප්‍රත්‍යය එක් වී අඳුම් - ඇඳුම් හැදෙන බව මා ළමයින්ට උගන්වා ඇත. මහාචාර්යවරයාගේ අදහස නිවැරදි නම්, පළඳ උම් = පැළඳුම්, උය උම් = ඉව්ම්, පිස උම් = පිසුම් ද පුර්තුගීසීන්ගෙන් ලැබුණු ඒවා විය යුතු ය.
පණ්ඩිතයකු ලෙස පිළිගැනුණු රතුමා ඒ ලිපිය ලියා ඇත්තේ කාට හෝ පහර දීමට බව සිංහල තේරෙන කවරකුට වුව ද නොතේරෙන්නට හේතුවක් නැත. ඉතින් ඒ සියළු ඇනුම් පද එතුමා කරා ද ඒකා-න්ත වශයෙන් පැමිණේ.
*"විදේශ ගත දෙමව්පියන්ගේ දරුවන්ට ... මව් බස භාවිතා කරන්නට ලැබෙන අවස්ථා (ව) ඉතා විරලය. එවිට.. භාෂාව ඈත් වෙයි. එහෙත්.. තුන් වන පරම්පරාවට අනිවාර්යයෙන්ම සිංහල භාෂාව අමතක වෙනයි. එය වරදක් ලෙස දැකිය නොහැකිය"* මේ නම් අනතුරුදායක, අසත්‍ය, අදූරදර්ශී කියමනකි. තමන් සිංහල වීම ගැන තැවෙන, සිංහල කම පිළිකුල් කරන සිංහලයන් ගැන සන්නසේ නිතර නිතර ලිපි පළවන නිසාත්, ලිපිය කෙටි කළ යුතු නිසාත් ඒ ගැන අද යමක් නොකියමි.

# වි. ක. ධර්මබන්ධු



## ලංකාවේ පරම්පරා දහයක් පහළොහක් ජීවත් වූ පරවුන්ට සහ ඉංගිරිසින්ට මහාචාර්යතුමා ඔය කියන ගාය හැදුණේ නැත. ඔහු තාමත් තම බස භාවිතා කරති..

එහෙත් මෙය නම් නොකියා ම නොහැකි සත්‍යයකි. පුරුතුගීසින්ගෙන් පැවත එන්නන් වාසය කරන ගමක් ගැන ලිපිය-ක් ශ්‍රී ලංකාවේ පුවත් පතක පළ වූ පුවතක් ගැන සන්නසේ මිතුරෙකුගෙන් අසන්නට ලැබිණි. එහි වැසියෝ අදත් පුරුතුගීසි බස කතා කරත් ලු. ලංකාවේ පරම්පරා දහයක් පහළොහක් ජීවත් වූ පරවුන්ට සහ ඉංගිරිසීන්ට මහාචාර්යතුමා ඔය කියන ගාය හැදුණේ නැත. ඔහු තාමත් තම බස භාවිතා කරති. වසර තිහකට පමණ පෙර ඕස්ටෙලියාවට පැමිණි ශ්‍රී ලාංකික බර්ගර් ජාතිකයකු මට පර්ත් නුවරදී හමු විය. ඔහු කිසි ගොතයක් නැතිව හොඳ සිංහලෙන් මා සමග කතා කරන විට මට ඇති වූයේ නිම් හිම් නැති සතුටකි. සියවස් එකහමා රකට පමණ පෙර මෙරටට පැමිණි චීන, වියට්නාම් ජාතිකයෝ ඔවුන්ගේ භාෂාව, චාරිත්‍ර වාරිත්‍ර රැකගෙන අදත් මේ ඔස්ටෙලියාවේ යහතින් වෙසෙති. ඔස්ටෙලියාවට පය ගැසූ කෙනෙහි සිංහල අමතකව ගිය සිංහලයන් නම් සිටිනා බව සමහරු කියති.
දෙමළකු සමග දෙමළෙන් කතා කළ නොහැකි දෙමළා හඩු (හැඩි) දෙමළකු බව කිව මනා නොවේ. ■

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055 | **WA** Kapila Hemantha Balage 08 9456 1972 |
| **QLD** Ananada Samaratunga 07 3372 7953 | **ACT** Asoka Nimalasiri 0439 925 241 |
| **SA** Chandta Eeriyagama 08 8331 2318 | **TAS** Anura Seneviratne 03 6327 4259 |

වෙළඳ දැන්වීම්/Advertising
ඩෙන්සිල් ජයවීර/ Denzil Jayaweera

**සන්නස පිරිවර**

| | |
|---|---|
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| අනුර හොරේෂස් | Anura Horetious |
| අසෝක සුබසිංහ | Asoka Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |
| වි ක ධර්මබන්ධු | W. K. Dharmabandhu |
| ආචාර්ය විද්‍යානි මනතුංග | Dr Vidyani Manathunga |
| චන්ද්‍රි මාපා | Chandi Mapa |
| ශ්‍රියාණි මද්දුමගේ | Sriyani Maddumage |
| මහින්ද දිසානායක දිවුල්ගනේ | Mahinda Dissanayaka Diwulgane |

සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

බෙදාහැරීම් සහය
ප්‍රියන්ත පෙරේරා

**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel : 03 9310 4196 /0425 720 932
Fax : 03 9310 5569